**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුරට වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම**

1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම සඳහා දෙපාර්තමේන්තුගත අධ්‍යක්ෂ වරුන් ඇතුළු සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද සහිත ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, 04 වන මහල, සෙත්සිරිපාය I වන අදියර,** බත්තරමුල්ල ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තානතුර සඳහා බඳවා ගැනීම"** ලෙස ලිවිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026 ජනවාරි මස 19 දින වේ.

   සටහන:- අයදුම්පත ලියාපදිංචි තැපැල මගින් එවීම අනිවාර්යය අතර, එය තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින් විඳදරා ගත යුතුය.

2. මෙහි දී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිශ්චය කරනු ලැබේ.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

   3.1. සේවා ගණය - SL-3-2025 විධායක

   3.2. මෙම තනතුර සඳහා පූර්ණ කාලීනව වැඩ බැලීමේ වැටුපක් ලබා දිය හැකිය.

   3.3. රාජ්‍ය සේවා පත්වීම් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීති අදාළ වේ.

   3.4. තෝරාගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද යටත්විය යුතුය.

4. සුදුසුකම්

   4.1. අධ්‍යාපන සුදුසුකම්

   විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනය වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලන, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, සමාජ සංවර්ධන, නීතිය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන් අතරින් එක් විෂයය ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

   හෝ

   එකී විෂය ක්ෂේත්‍රයන්ගෙන් නිලධාරින්ට පැවරෙන බහුවිධ කළමනාකරණ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා ගැනීම සඳහා යෝග්‍යයැයි විෂයභාර ආමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන

වෙනත් විෂය ක්ෂේත්‍රයක් අතරින් අවම වශයෙන් එක් විෂයය ක්ෂේත්‍රයකට අදාළව වශ්වාත් උපාධියක් ලබා තිබීම.

4.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

4.3. පළපුරුද්ද :

I. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ (අභ්‍යන්තර විගණක නොවන) තනතුරක පළමු ශ්‍රේණියේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම.

II. ඉහත උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට සුදුසුකම් ලබන සේවා ගණයේ තනතුරු වලට අදාළ විධායක ශ්‍රේණියේ වසර 18කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4.4. වෙනත් :

I. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

II. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ තුළ වාර්ෂික කාර්යසාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා සඳහන් විධිවිධානයන්ට අනුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5. තනතුරට අදාළ කාර්යයන්

5.1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුරට පවරන රාජකාරි

6. වයස් සීමාව - අදාළ නොවේ

7.7.1 බඳවා ගැනීමේ ක්‍රමය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතුව බැංකු ක්ෂේත්‍රයේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු හා දිප ව්‍යාප්ත සේවාවක නිලධාරියකුගෙන් යුතුව සමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කරනු ලබන යෝග්‍යතා ඇගයීමකින් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (දෙපාර්තමේන්තුගත) තනතුරට බඳවා ගනු ලැබේ.

7.2 ලකුණු ලබාදීමේ ක්‍රමය

| අනු අංකය | ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨතාවය | 40 | 10 |
| 02 | අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 20 | 10 |
| 03 | ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති නව්‍ය සංකල්ප හා වැඩසටහන් | 20 | 10 |
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | 05 | 03 |
| 05 | පළපුරුද්ද | 05 | 03 |
| 06 | භාෂා ප්‍රාගුණ්‍යය | 05 | 03 |
| 07 | පරිගණක දැනුම | 05 | 03 |

සටහන:- I. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් අතුළත් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

II. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

සී. ඩී. කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.